කුරුඳු කොළ කොම්පෝස්ට්

සාදා රසායනික පොහොර භාවිතය අඩුකොට

කුරුඳු අස්වැන්න වැඩි කරමු.

කුරුඳු ශාකය පසෙහි ඇති සාරවත් බවට හොඳින් ප්‍රතිචාර දක්වන බෝගයකි. අස්වැන්න ලෙස පඳුරේ ඇති ගස් බොහොමයක් කොළ ද සමඟ සම්පූර්ණයෙන් ම ඉවත් කරන නිසා බොහෝ පෝෂක ප්‍රමාණයක් පසෙන් ඉවත් වන අතර එවිට සිදුවන පස නිරාවරණය නිසා ඇති වන සෝදා පාළුව මගින් ද සැළකිය යුතු පෝෂක ප්‍රමාණයක් පසෙන් ඉවත් වේ. කුරුඳු සඳහා වඩා යෝග්‍ය ප්‍රදේශ වන ශ්‍රී ලංකාවේ තෙත් සහ අතරමැදි කළාපවල සාපේක්ෂ ලෙස ඇති වැඩි වර්ෂාපතනය ද පසෙහි සාරවත් බව අඩු කරනු ලබයි.

මෙම හේතූන් නිසා වගාකරුවන් නිර්දේශිත පොහොර ප්‍රමාණයටත් වඩා අධික පොහොර ප්‍රමාණයක් කුරුඳු වගා බිම්වලට යෙදීමෙන් මේ වනවිටත් බොහොමයක් කුරුඳු වගාවන්වල පස හානියට ලක්වී හෙවත් නිසරු වී ඇත.

මෙනිසා කුරුඳු වගාකර ඇති මෙවැනි බිම් නැවත පුනරුත්තාපනය කිරීම අත්‍යාවශ්‍ය කාර්යයක් වී ඇත. මේ සඳහා ඉතා පහසු සහ කාර්යක්ෂම ක්‍රමයක් වනුයේ පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීම වුවද ප්‍රායෝගිකව එවැනි කුරුඳු බිම් වලට සරිලන ප්‍රමාණවලින් කාබනික ද්‍රව්‍ය සපයා ගැනීම අපහසු වේ.

මෙම ගැටලුවට සාර්ථක පිළියමක් ලෙස ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය විසින් සිදුකරන ලද අත්හදාබැලීම්වල ප්‍රතිඵලයන් ආශ්‍රිතව කුරුඳු කොළ යොදා ගනිමින්

"කොම්පෝස්ට් සාදා නිර්දේශිත රසායනික පොහොර ප්‍රමාණය අඩක් දක්වා අඩුකොට වගාවට යෙදීමෙන් ඉතා ඉහළ අස්වනු ලබා ගත හැකි බව සොයා ගෙන ඇත."

අවශ්‍ය ද්‍රව්‍ය

කුරුඳු කොළ කොම්පෝස්ට් සාදාගැනීමේදී අස්වැන්න නෙලූ පසු ක්ෂේත්‍රයේ ඉතිරිවන කොළ සහ අතු දින කිහිපයක් එහි තබා මේ සඳහා යොදාගත හැක.

- **කුරුඳු කොළ කිලෝ ග්‍රෑම් 40 ක්**
- **ගොම කිලෝ ග්‍රෑම් 8 ක්**
- **රොක් පොස්පේට් කිලෝ ග්‍රෑම් 2 ක්**

කුරුඳු කොළ සුලබතාවය අනුව යොදා ගත හැකි කුරුඳු කොළ ප්‍රමාණය වෙනස් වේ.

සාදාගන්නා ආකාරය

1. කොම්පෝස්ට් සාදාගැනීමට සුදුසු ස්ථානයක් තෝරාගෙන මීටර් 1 ක් පමණ පළලට සහ පහසු දිගකට කුරුඳු කොළ සහ ඉති අතුරා අඩියක් පමණ උසට

2

අනතුරුව ගොම සහ රොක් පොස්පේට් ජලයේ මිශ්‍රකර සාදා ගත් දියර කුරුඳු කොළ මතට ඉසින්න. .

3

පසුව මල් බාල්දියක් ආධාරයෙන් ජලය ගෙන කුරුඳු කොළ මතට එකතු කරන ලද එම මිශ්‍රණය නොසේදී යන සේ ජලය එකතු කොට නැවතත් පළමු ආකාරයට කුරුඳු කොළ සහ ඉති අතුරන්න. එසේම නැවතත් ගොම සහ රොක් පොස්පේට් මිශ්‍ර දියරය කුරුඳු කොළ මතට ඉසින්න.

4

මෙලෙස තට්ටු 4-5 ක් උසට මෙම කුරුඳු කොළ ගොඩක් ආකාරයට සකසා අගල් 6 ක් පමණ වටේ ඉතිරි වන සේ පොලිතීන් කැබැල්ලකින් වසා තබන්න.

මාසයකට වරක් බැගින් මෙම කුරුඳු කොළ ගොඩ ප්‍රමාණවත් තරමට වතුර ඉසිමින් තෙවරක් කළවම් කොට මාස 4ක් ගතවූ පසු හලාගන්න.

මෙලෙස ලබාගන්නා නිෂ්පාදනය කුරුඳු කොළ පොස්පො-කොම්පෝස්ට් ලෙස හැඳින්වේ.

සාමාන්‍යයෙන් කුරුඳු කොළ අස්වැන්න එම ක්ෂේත්‍රයෙන් ලබාගන්නා වියළි කුරුඳු පොතු අස්වැන්න මෙන් 10 - 12 ගුණයක් පමණ වන අතර යොදා ගන්නා ලද කුරුඳු කොළ ප්‍රමාණයෙන් අඩක් පමණ ප්‍රමාණයකට කුරුඳු කොළ කොම්පෝස්ට් ලබාගත හැක. එසේම නිපදවා ගතහැකි කුරුඳු කොළ කොම්පෝස්ට් ප්‍රමාණය එම කුරුඳු කොළ ලබාගත් ක්ෂේත්‍රයෙන් අඩකට එක් වසරකදී යෙදිය හැකි අතර මීළඟ අස්වනු නෙළීමේදී සාදාගතහැකි කොම්පෝස්ට් ප්‍රමාණය එම ක්ෂේත්‍රයේ ඉතිරි අඩට යෙදිය හැකිවේ. ලබාගෙන ඇති පර්යේෂණ තොරතුරු අනුව වර්තමාන කුරුඳු පොහොර නිර්දේශයෙන් අඩක් එනම් අක්කරයකට කිලෝ ග්‍රෑම් 180 ක් (යූරියා කිලෝ ග්‍රෑම් 90, රොක් පොස්පේට් කිලෝ ග්‍රෑම් 45 සහ මියුරියේට් ඔෆ් පොටෑෂ් කිලෝ ග්‍රෑම් 45) සමග කුරුඳු කොළ කොම්පෝස්ට් ටොන් 4 ක් (කුරුඳු පඳුරකට කිලෝ ග්‍රෑම් 1.1 ක්) යෙදීමෙන් අස්වැන්න 10-12% කින් පමණ වැඩි කරගත හැකි බව පෙන්වා දී ඇත. එසේම ඉහත කාබනික සහ අකාබනික පොහොර මිශ්‍රණය භාවිතා කිරීමේදී කුරුඳු පොතු තෙල්වල ඉයුජිනෝල් ප්‍රමාණය අඩුවන බවට සහ කුරුඳු කොළ තෙල්වල සිනමැල්ඩිහයිඩ් ප්‍රමාණය අඩුවන බවට තොරතුරු ලැබී ඇත. එසේම පාංශු විශ්ලේෂන වාර්තා අනුව මෙම පොහොර මිශ්‍රණය භාවිතයෙන් පසෙහි ගුණාංග බොහොමයක් වැඩි දියුණු වන බව එනම් පසෙහි කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය සහ පාංශු පෝෂක සැළකිය යුතු ප්‍රමාණයකින් ඉහළ යන බව වාර්තා වී ඇත.

මෙනිසා තිරසර සහ ඉහළ අස්වැන්නක් ලබා ගැනීම සඳහා කුරුඳු කොළ භාවිතා කොට

කුරුඳු කොළ පොස්පො-කොම්පෝස්ට්

ඔබේ වගාවට යෙදීමෙන් වාසි රැසක් ලබාගන්න.

අටුකොටු පිරී රටක් - අතමිට සරු හෙටක් සඳහා....

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

1095, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, පේරාදෙණිය. දුරකතන 081-2388651

වැඩිදුර තොරතුරු සඳහා විමසීම් :

ජාතික කුරුඳු පර්යේෂණ සහ පුහුණු මධ්‍යස්ථානය,
පලොල්පිටිය, තිහගොඩ, මාතර.
දුක. 041-5673941 ඊ-මේල් : ncrtcmatara@gmail.com

රචනය :
ආචාර්ය ඩී. ඒන්. සමරවීර
අධ්‍යක්ෂ (පර්යේෂණ)

සැකසුම :
මාධ්‍ය හා සන්නිවේදන අංශය
අපනයන කෘෂිකර්ම
දෙපාර්තමේන්තුව

Graphics@Prasanna